*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 97-115*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.82

ශ්‍රී ලංකාවේ පුස්තකාල නාමාවලි සහ තොරතුරු සංග්‍රහ

# Library Directories and Information Bulletins in Sri Lanka

**Balasooriya, Priyani**

**Abstract**

Directories of libraries or librarians could be used as a valuable source of information in making decisions and given information related to various aspects of librarianship. However, the usability of such directories becomes limited due to the lack of coverage of all libraries or librarians concerned and not being up to date. In such situations, decisions taken based on such sources of information become problematic or unjustifiable. This researcher has identified the need to examine the directories compiled so far as a preliminary step in compiling a new directory of librarians/Library professionals in Sri Lanka. Accordingly, the objective of the study is to introduce to the library professionals the concept of the library directories and the need for keeping them up to date. It also aimed to convince them that furnishing of individual information to compile library directories as one of their responsibilities. Information on each directory condensed and presented separately under each title. This research article is presented based on a study of twenty-six (26) directories published from 1980 to 2018 under the theme. Print copies of library directories held in the Academic and Research divisions of the National Library Services Board, the Colombo Public Library, D.S. Senanayaka Memorial Public Library and the Library of Sri Lanka, National Achieves and Sri Lanka Institute of Development Administration have been used for data collection. In addition, website of the Sri Lanka Library Association and the Directory of ULA members published on the website of the University Librarians' Association of Sri Lanka perused. The contents of directories verified with the use of secondary sources information for evaluation. Certain directories were compiled with just mentioning the name, address and phone numbers of the library, while some others have included information related to the library, such as library resources, services, library users, software used, library staff, library infrastructure, annual budget allocations etc. With the advent of Information and Communication Technologies in libraries it was observed to provide more systematic directories. The compilation of library directories is not a simple task. In order to give a subjective approach, a great amount of dedication, involvement, and cooperation is essential. Although it is difficult to publish library directories in print form, publishing them on electronic form is not that difficult. However, it is to be stressed here that continuous revision and updating is essential.

**Keywords: Library, Librarian, Library professional, Library Directories, Librarians' Directories, Librarians' Database, Sri Lanka, Information Bulletins**

[1]Librarian, Sri Lanka Institute of Development Administration, Sri Lanka

Email: priyani@slida.gov.lk

Received: 09th December2024, Accepted revised version: 19th June 2025
This work is licensed under a Creative Commons Attribution-Share Alike 4.0 International License.

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 97-115*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.82

**සංක්ෂේපය**

පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ විවිධ තීරණ තීන්දු ගැනීමේ කටයුතුවලදී සහ පුස්තකාල හා විඥාපන විද්‍යාව සම්බන්ධ තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් පුස්තකාල හෝ පුස්තකාලවේදීන් පිළිබඳව තොරතුරු ඇතුළත් නාමාවලි මඟින් ලබාගත හැකි ප්‍රයෝජන ඉමහත්ය. පුස්තකාල හෝ පුස්තකාලවේදීන් පිළිබඳ සකසන ලද නාමාවලියක අන්තර්ගතයේ එම නාමාවලියේ තේමාවට අදාළ සියලුම පුස්තකාල ආවරණය නොවීමත්, කාලීනව යාවත්කාලීන නොකිරීමත් නිසා එහි ගුණාත්මක බව අඩුවේ. එම නාමාවලි පදනම් කරගෙන ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගන්නා අවස්ථාවන්හිදී අසාධාරණයක් මෙන්ම ගැටලු සහගත තත්වයනට මුහුණ පෑමට සිදුවේ. මෙතෙක් ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්කොට ඇති නාමාවලි හඳුනාගැනීම සහ එම නාමාවලිවල ප්‍රමාණාත්මක සහ ගුණාත්මක බව අධ්‍යයනය කිරීම කාලෝචිතය. පුස්තකාල නාමාවලි හඳුනාගැනීම, ගුණාත්මක සහ ප්‍රමාණාත්මක බව ඇගයීම, නිරන්තර යාවත්කාලීන කිරීමේ වටිනාකම සහ එසේ යාවත්කාලීන කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම පුස්තකාලයාධිතීන් වශයෙන් තම වගකීමක් බව ඒත්තු ගැන්වීම මෙම අධ්‍යයනයේ අරමුණු විය. 1980 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ ප්‍රකාශයට පත්කොට ඇති නාමාවලි විසිහයක් (26) පාදක කාරගෙන සිදු කරනු ලැබූ අධ්‍යයනයක් ඇසුරින් මෙම පර්යේෂණ ලිපිය ඉදිරිපත් කරනු ලැබේ. ද්විතියික දත්ත යොදා ගනිමින් අන්තර්ගත තොරතුරු ප්‍රමාණාත්මකව ඇගයීමට ලක් කරන ලද අතර, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යාපන අංශය සහ පර්යේෂණ අංශය, කොළඹ මහජන පුස්තකාලය, මහනුවර ඩී. එස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පුස්තකාලය සතුව පවතින මුද්‍රිත නාමාවලී පරිශීලනය කරන ලද අතර ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (SLLA) වෙබ් අඩවියේ සහ විශ්වවිද්‍යාලයීය පුස්තකලයාධිපතීන්ගේ සංගමයේ (ULA) වෙබ් අඩවියේ මෘදු පිටපත් මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්කර ඇති පුස්තකාලවේදින්/පුස්තකාල වෘත්තිකයින් පිළිබඳ නමාවලි ද අධ්‍යයනය කරන ලදි. එක් එක් නාමාවලි වෙන වෙනම අධ්‍යයනය කොට ලබාගත් තොරතුරු පදනම් කරගෙන එම නාමාවලිවල අන්තර්ගතය සංක්ෂිප්තව ඉදිරිපත් කර ඇත. ඇතැම් නාමාවලිවල පුස්තකාලයේ නම, ලිපිනය සහ දුරකථන අංකය පමණක් ඇතුළත් කරමින් සකස් කොට තිබූ අතර, සෙසු නාමාවලි පුස්තකාලයට අදාළ සියලු තොරතුරු සංක්ෂිප්තව සටහන් කරමින් තොරතුරු සංග්‍රහයක් ලෙස හඳුන්වා තිබුණි. තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ වඩාත් විධිමත් ස්වරූපයෙන් පුස්තකාල වර්ග සහ පුස්තකාලවේදීන් සම්බන්ධව ද නාමාවලි සකස් කොට තිබෙන බව දක්නට හැකි විය. පුස්තකාල සහ පුස්තකාලවේදීන් සම්බන්ධව නාමාවලියක් සම්පාදනය කිරීම සරල කර්තව්‍යයක් නොවන අතර විෂයානුබද්ධ පිළිවෙළකට සිදු කළ යුතු වන හෙයින් යථානුරූපව තොරතුරු ඒකාරාශි කර ගැනීම සඳහා දැඩි කැපවීමක් කළ යුතුය. අතීතයේදී සාම්ප්‍රදායික ක්‍රමයකට නාමාවලි සැකසීම අසීරු කර්තව්‍යයක් වුවද වර්තමානයේ තොරතුරු තාක්ෂණයේ නව මානයන් භාවිත කොට නාමාවලියක් සම්පාදනය කළ යුතු අතර ඒවා අඛණ්ඩව යාවත්කාලීන කළ යුතු බවට යෝජනා කෙරිණි.

මුඛ්‍ය පද : පුස්තකාල, පුස්තකාලයාධිපතීන්, පුස්තකාලවේදීන්, පුස්තකාල නාමාවලි, පුස්තකාල,

පුස්තකාලයාධිපතිවරුන්ගේ නාමාවලිය, පුස්තකාලයාධිපතිවරුන්ගේ දත්ත සමුදාය,

ශ්‍රී ලංකාව, තොරතුරු සංග්‍රහ

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 97-115*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.82

**හැඳින්වීම - Introduction**

ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂයට අනුව, නාමාවලිය යන්නෙහි තේරුම අකාරාදි පිළිවෙළට සකස් කරන ලද නම ලිපිනය හා දුරකථන අංක ඇතුළත් ලැයිස්තුව ලෙස දක්වා ඇත. (ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂය, 2018). "නාමාවලිය" යන වචනය ලතින් වචනයක් වන අතර "එය දුරකථන නාමාවලි වලින්" ආරම්භ වූ අතර එය අකාරාදී පිළිවෙලට හෝ යම් කැමති අනුපිළිවෙලකට පුද්ගලයින් හෝ සංවිධාන/ආයතන සම්බන්ධ තොරතුරු ලැයිස්තුගත කරන ලද පොතක්, සීඩී, ඩීවීඩී හෝ වෙබ් අඩවියක් ලෙස අර්ථ දැක්විය හැකිය. එනම්, පුද්ගලයයින්ගේ/සංවිධානයේ හෝ ආයතනයේ නම, ලිපිනය, ජංගම හෝ දුරකථන අංක, විද්‍යුත් තැපැල යනාදිය ඇතුළත් ලේඛනයකි. නාමාවලියෙහි ප්‍රධාන අරමුණ වන්නේ පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක හෝ නමකින් හෝ වෙනත් ක්ෂේත්‍රවලින් හඳුනාගත් ඕනෑම ආයතනයක විස්තර සොයා ගැනීමට අවකාශය සැලසීමයි.

ඒ අනුව රටක යම් නිශ්චිත කාලවකවානුවක් තුළ සිදු කරනු ලැබූ කිසියම් විශේෂිත වූ කාර්යයන්, සේවාවන්, නිෂ්පාදන, ආයතන ආදිය පිළිබඳ තොරතුරු ඒකරාශි කර තැබීම ඒ සම්බන්ධව අධ්‍යයනවල නිරත වන විද්‍යාර්ථයින්ට ඉතා වැදගත්ය. උපයෝජකයින්ට පහසුවෙන් ප්‍රවේශවීමට හැකි අයුරින් රැස් කරගත් තොරතුරු ක්‍රමානුකූලව යම් ආකෘතියකට අනුව කර පිළියෙළ කරන්නා වූ කෘතියක් නාමාවලියක් (Directory) ලෙස හැඳින්විය හැකිය. දුරකථන නාමාවලි, වෙළඳ නාමාවලි, ග්‍රන්ථනාමාවලි, පුස්තකාල නාමාවලි ආදි ලෙස විවිධ නාමාවලි දක්නට ඇත. වඩාත් සවිස්තරාත්මකව තොරතුරු අන්තර්ගත නාමාවලි තොරතුරු සංග්‍රහ (Bulletins) වශයෙන්ද හඳුන්වයි. භාවිතය සහ බෙදා හැරීම පහසු කිරීම සඳහා අද බොහෝ නාමාවලි ඩිජිටල් මාධ්‍යයෙන් පළ කෙරේ.

පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ විවිධ තීන්දු තීරණ ගැනීමේ කටයුතුවලදී තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් පුස්තකාල හෝ පුස්තකාලවේදීන් පිළිබඳව තොරතුරු ඇතුළත් නාමාවලියක් මගින් ලබා ගත හැකි ප්‍රයෝජන ඉමහත්ය. **"ශ්‍රී ලංකාවේ පුස්තකාල නාමාවලි සහ තොරතුරු සංග්‍රහ පිළිබඳ අධ්‍යයනයක් "** යන තේමාව යටතේ 1980 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ ප්‍රකාශයට පත් කොට ඇති නාමාවලි සම්බන්ධව ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව සිදු කරනු ලැබූ අධ්‍යයනයක ප්‍රතිඵල මෙම පර්යේෂණ ලිපිය මගින් ඉදිරිපත් කරනු ලැබේ.

**නාමාවලියක් යනු කුමක්ද?- What is a Directory**

නාමාවලියක් (Directory) යනු යම් මාතෘකාවකට අදාළව එයටම සුවිශේෂී පුද්ගලයින් හෝ ආයතන පිළිබඳව තොරතුරු ඇතුළත් අනුක්‍රමික ලැයිස්තුවක් ලෙස හැඳින්විය හැකිය. ගුණසේන මහා සිංහල ශබ්දකෝෂයට අනුව, "නාමාවලිය - නම් ලැයිස්තුව" (2014), (පි. 973) ලෙස ද, කේම්බ්‍රිජ්

ශබ්දකෝෂයට අනුව නාමාවලිය යන්න නම, ලිපිනය හෝ වෙනත් කරුණු ඇතුළත් පොතක් ලෙස දක්වා ඇත. (Cambridge Advanced Learner's Dictionary, 2003 ( පි. 344) ලෙස ද දක්වා ඇත. නාමාවලියක් පිළිබඳව දැක්විය හැකි තවත් සවිස්තරාත්මක නිර්වචනයක් නම්,

> "Directory - a book listing individuals or organization alphabetically or thematically with details such as names, addresses and telephone numbers". ලෙස දැක්විය හැකිය.

මෙම නිර්වනවලට සමගාමීව විවිධ ආයතන මගින් විවිධ අරමුණු උදෙසා පිළියෙළ කර ඇති නාමාවලිවල අන්තර්ගත වන තොරතුරුවල ස්වභාවය අනුව නාමාවලිය පිළිබඳ නිර්වචනයේ අන්තර්ගත උපාංග ද වෙනස් වේ. පුස්තකාල විද්‍යාවට අනුව නාමාවලියක් යන්න පිළිබඳව හැරල්ඩ් පුස්තකාල විද්‍යා පදමාලාවට අනුව අර්ථ දක්වා ඇත්තේ මෙසේය.

"A book containing lists of names of residents, organizations or business houses in a town, a group of towns or a country, in alphabetical order, and/or in order of situation in reads, or of firms in trade classifications arranged in alphabetical order; or of professional people, manufacturers or business houses in a particular tread or profession". (Harrods's Librarian Glossary, 2018).

මෙම නිර්වචන අධ්‍යයනය කරන විට නාමාවලියක් යනු යම් මාතෘකාවකට අදාලව එයටම සුවිශේෂී පුද්ගලයින් හෝ ආයතන පිළිබඳව නම් ලැයිස්තුව නැතහොත් තොරතුරු ඇතුළත් අනුක්‍රමික ලැයිස්තුවක් සරලව හැඳින්විය හැක. නාමාවලියක අන්තර්ගත විය යුතු තොරතුරු කොතරම් දුරට ආවරණය කරමින් ශ්‍රී ලංකාවේ පුස්තකාල විද්‍යා විෂයය යටතේ කොපමණ නාමාවලි ප්‍රමාණයක් සම්පාදනය කොට පවතීද, ඒම නාමාවලිවල ඇතුළත්වන තොරතුරු කවර ආකාරයෙන් යුක්ත ද යන්න විමසා බැලීමට කරන ලද උත්සාහයක් ලෙස මෙම අධ්‍යයනය හඳුන්වා දිය හැක.

### පර්යේෂණ ගැටලුව - Research Problem

බොහෝ ආයතනවල තම ආයතනික වෙබ් අඩවියේ හෝ වෙනත් ප්‍රකාශනවල තම ආයතන පුස්තකාලය හෝ පුස්තකාලයාධිපතිවරු සම්බන්ධ තොරතුරු බොහෝ විට සඳහන් කොට නොමැත. පුස්තකාල/පුස්තකාලයාධිපතිවරුන් පිළිබඳ තොරතුරු නාමාවලියක ස්වරූපයෙන් ලබා ගැනීමට හැකියාව පවතී නම් සාමාන්‍ය ජනතාවට වුවද තමාට අවශ්‍ය තොරතුරු අදාළ පුස්තකාලයාධිපතිගෙන් දුරකථන ඇමතුමක් ලබා දීමෙන් හෝ විද්‍යුත් තැපැලක් යැවීමෙන් ඉල්ලා සිටීමට හැකියාව පවති. ඒබැවින් පුස්තකාල සහ පුස්තකාලයාධිපතිවරු සම්බන්ධ නාමාවලි පැවතීම මහජනතාවට උපකාරී වන අතර පුස්තකාල හෝ පුස්තකාලවේදීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම උදෙසා නාමාවලි සකසා තිබීම ඉතා වැදගත්ය. ශ්‍රී ලංකාව තුළ පුස්තකාල හෝ පුස්තකාලයාධිපතීන් සම්බන්ධයෙන් දැනට

පවත්නා නාමාවලි ප්‍රමාණය ප්‍රමාණවත්ද ?, එම නාමාවලිවල තේමාවට අදාල සියලු තොරතුරු අන්තර්ගතව පවතිද ?, ඒවා නිරන්තරව යාවත්කාලීන වන්නේද? යන්න පර්යේෂණ ගැටලුව හා සම්බන්ධ ප්‍රශ්න ලෙස දැක්විය හැකිය.

**අධ්‍යයනයේ පසුබිම - Background of the Research**

"විශේෂයෙන් මිනිසුන් වෙනත් තාක්ෂණ ක්‍රම මගින් සම්බන්ධ වී නොමැති කල්හී, සාම්ප්‍රදායික දුරකථන නාමාවලි සඳහා අවශ්‍යතාව තවමත් පවතී. පුස්තකාලයාධිපතිවරුන් සැමවිටම තොරතුරු සහ දැනුම සඳහා දොරටුව ලෙස සලකනු ලැබේ. ඔවුන් පොත් සහ ලේඛන තොරතුරුවල විවිධ මූලාශ්‍ර සමඟ කටයුතු කරයි. ඔවුන්ගේ සම්බන්ධතා ලිපිනය, විශේෂයෙන් තැපැල් ලිපිනය, ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය සොයා ගත හැකි නම්, ලොව පුරා සිටින තොරතුරු සොයන්නන්ට අවශ්‍ය තොරතුරු සඳහා පහසුවෙන් ඔවුන් හා සම්බන්ධ විය හැකිය. කෙසේ වෙතත්, පුස්තකාලයාධිපතිවරයෙකු හා සම්බන්ධ තොරතුරු ආයතනික වෙබ් අඩවියේ හෝ වෙනත් මූලාශ්‍රවල නොමැත. පුස්තකාලයාධිපතිවරුන් පිළිබඳ සම්බන්ධතා තොරතුරු නාමාවලියක ස්වරූපයෙන් යුක්ත නම් එම තොරතුරු මූලාශ්‍රය භාවිත කොට සාමාන්‍ය ජනතාවට දුරකථන ඇමතුමක් ලබා දීමෙන් හෝ විද්‍යුත් තැපැලක් යැවීම මඟින් යම් පුස්තකාලයකින් තමාට අවශ්‍ය තොරතුරු ඉල්ලා සිටීමට උපකාරී වේ. ඇසෑම් හි විවිධ වර්ගයේ පුස්තකාලවල එකිනෙකා ගැන වැඩි යමක් නොදැන සේවය කරන දහස් ගණනක් පුද්ගලයින් සිටිති. නාමාවලියක ස්වරූපයෙන් ඔවුන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඔවුන් එකට එකතු කිරීමට, සම්බන්ධතා ඇති කර ගැනීමට, ඔවුන්ගේ දැනුම එකිනෙකා සමඟ බෙදා ගැනීමට, වෘත්තීය ගැටලු විසඳීමට යනාදි කාර්යයන්ට උපකාරී වේ. පුස්තකාල යනු තොරතුරු සඳහා දොරටු වන අතර බොහෝ අවස්ථාවලදී තොරතුරු බෙදා හැරීමේදී පුස්තකාලයාධිපතිවරයා වගකිව යුතුය. එබැවින්, මුද්‍රිත සහ ජංගම දුරකථන සඳහා අනුකූල ආකෘතියකින් සමන්විත නාමාවලියක් පවති නම්, රජය සහ ඒ හා සමාන ආයතන විසින් පුස්තකාලයාධිපතිවරුන් සහ පුස්තකාල හරහා ඕනෑම ආකාරයක දැනුම් නිෂ්පාදන පහසුවෙන් බෙදා හැරීමට උපකාරී වනු ඇත" (Barman, 2020).

පර්යේෂිකාව විසින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයින්ගේ තොරතුරු ඇතුළත් නාමාවලියක් සම්පාදනය කිරිමේ කාර්යයයේ නිරත විමේදී මෙතෙක් ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කොට ඇති පුස්තකාල සම්බන්ධ තොරතුරු ඇතුළත් නාමාවලි හඳුනා ගැනීම සහ එම නාමාවලිවල ප්‍රමාණාත්මක සහ ගුණාත්මක බව පිළිබඳ අධ්‍යයනය කිරිම කාලෝචිත කාර්යයක් ලෙස සලකන ලදි.

නාමාවලිය පරිශිලනය කිරිමේදී එම නාමාවලිවල අනතර්ගතය නමාවලියේ තේමාවට අදාළ සියලුම පුස්තකාල ආවරණය නොවීම හේතුවෙන් තත්කාලීන නිරවද්‍ය දත්ත ලබා ගත නොහැක. එමෙන්ම තොරතුරු යාවත්කාලීන නොවිම නිසා එම නාමාවලිය පදනම් කරගෙන ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගන්නා අවස්ථාවන්දී අසාධාරණයක් මෙන්ම ගැටලු සහගත තත්වයනට මුහුණ පෑමට සිදුවේ. දැනට

ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කොට ඇති පුස්තකාල සහ පුස්තකාලවේදීන් පිළිබඳ නාමාවලි අධ්‍යයනයට ලක් කිරිමේදී ඒවායේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක බව සම්බන්ධ ගැටලු පැන නැගිණ.

**අධ්‍යයනයේ අරමුණු -Aims of the Research**

මෙම අධ්‍යයනය මගින් ප්‍රශ්න වශයෙන් අරමුණු හතරක් වෙත අවධානය යොමු කරන ලදි.

- දැනට ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්කර ඇති පුස්තකාල/පුස්තකාලයාධිපතිවරු සම්බන්ධ නාමාවලි හඳුනාගැනීම.
- ඒම නාමාවලි මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු ප්‍රමාණාත්මකව ඇගයීම.
- නාමාවලිවල අන්තර්ගත තොරතුරු සහ ඉදිරිපත් කර ඇති ස්වරූපය අනුව එහි ඇතුළත් තොරතුරුවල ගුණාත්මක බව ඇගයීමට ලක් කිරිම.
- පුස්තකාල/පුස්තකාලයාධිපතිවරු සම්බන්ධ නාමාවලි සම්පාදනයේ ඇති අවශ්‍යතාවය සහ වැදගත්කම අවධාරණය කිරිම.

**පර්යේෂණ ක්‍රමවේදය - Research Methodology**

මේ යටතේ ද්විතියික දත්ත යොදා ගනිමින් නාමාවලි විසිහයක් (26) පාදක කොටගෙන ප්‍රමාණාත්මක අධ්‍යයනයක් කරන ලදි. එක් එක් නාමාවලියේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක බව පිළිබඳ විශ්ලේෂණය කරන ලදි. මෙහිදි එම නාමාවලි සකස් කොට ඇති ස්වරූපය අධ්‍යයනයට ලක් කරන ලද අතර, එහි අන්තර්ගත තොරතුරු සහ ඒවා ඉදිරිපත් කර තිබූ ස්වරූපය අනුව එය කොතරම් දුරට මහජන තොරතුරු අවශ්‍යතා ඉටු කරනු ලබයි ද? යන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් එහි ගුණාත්මක බව ඇගයීමට ලක් කරන ලදි. එම විශ්ලේෂිත දත්ත ඇසුරෙන් නාමාවලි පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යාපන අංශය සහ පර්යේෂණ අංශය, කොළඹ මහජන පුස්තකාලය, මහනුවර ඩී.එස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පුස්තකාලය සතුව පවතින මුද්‍රිත නාමාවලි පරිශීලනය කරන ලදි. ඊට අමතරව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (SLLA) වෙබ් අඩවියේ සහ විශ්වවිද්‍යාලයීය පුස්තකලයාධිපතීන්ගේ සංගමයේ (ULA) වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කර ඇති පුස්තකාලවේදීන්/පුස්තකාල වෘත්තිකයින් පිළිබඳ නාමාවලි ද අධ්‍යයනයට ලක් කරන ලදි. ඒ අනුව මෙහිදි නාමාවලි විසි හයක් (26 ක්) අධ්‍යයනය සඳහා භාවිත කරන ලදි.

**පර්යේෂණ සීමාවන් - Limitation of the Research**

අධ්‍යයන කාල සීමාව තුළ පර්යේෂිකාවට භාවිත කිරීමට හැකි වූයේ ශ්‍රී ලංකාවේ මෙතෙක් ප්‍රකාශයට පත්ව ඇති නාමාවලි ප්‍රමාණයෙන් කොටසක් පමණි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට පුස්තකාල පිළිබඳ නාමාවලියක් ප්‍රකාශයට පත් කර ඇත්තේ 1980 වර්ෂයේදීය. 1980 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ නාමාවලි ගණනාවක්ම සම්පාදනය කර ඇතත්, පර්යේෂිකාවට භාවිත කළ හැකි වූයේ මුද්‍රිත නාමාවලි විසිහතරක් (24) සහ මෘදු පිටපත් වශයෙන් පවතින නාමාවලි දෙකක් (02) පමණි. එසේම ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් නාමාවලි රැසක් ප්‍රකාශයට පත් කොට ඇතත් අධ්‍යයන කාල සීමාව තුළ ජාතික පුස්තකාලයේ අංශ කිහිපයක් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වසා තිබූ බැවින් එම ආයතනයේ පර්යේෂණ අංශය සහ අධ්‍යාපන අංශය සතුව පැවති නාමාවලි පමණක් භාවිත කිරීමට සිදුවීම මත අධ්‍යයනය සඳහා පරිශීලනය කළ නාමාවලි ප්‍රමාණය සීමිත විය.

**නාමාවලිවල ඇති ප්‍රයෝජන - Advantages of a Directory**

නාමාවලියක ඇති ප්‍රයෝජන සම්බන්ධයෙන් සාකච්ඡා කර බලන විට මතු සඳහන් අර්ථකථන වැදගත්වේ. ඒ යටතේ, පුස්තකාල නාමාවලියක පවතින වැදගත්කම සම්බන්ධව මහාචාර්ය සෝමරත්න බාලසූරිය, (2013)පුස්තකාල වෘත්තිකයන් පිළිබඳ නාමාවලියේ පෙරවදනෙහි මෙසේ සඳහන් කර ඇත.

" The latest publication of this nature is the "Directory of Library Professionals in Sri Lanka". This Directory is useful in different ways, It is useful in searching Information on resource persons for training programms, workshops, seminars etc. This kind of sources are useful in policy making and implementation of programmes for the benefit of Library Professionals"- Balasooriya, (2013).

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ප්‍රකාශයට පත්කර ඇති දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ නමැති නාමාවලිවල එහි පෙරවදනෙහි එවකට සභාපති ලෙස කටයුතු කරන ලද ඊශ්වරි කොරයා මහත්මිය, නාමාවලියක පවතින වැදගත්කම පිළිබඳව මෙසේ සඳහන් කර ඇත.

" .... මේ තොරතුරු ජාතික පුස්තකාල සේවාවන් සැලසුම් කිරීමට මෙන්ම. ඒ ඒ අමාත්‍යාංශවලට සම්බන්ධ විවිධ පළාත් සහ සහ වෙනත් ප්‍රාදේශිය පරිපාලන ආයතනවල පුස්තකාල සංවර්ධන කටයුතු වලටත්, පොදුවේ මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියලුම දේශිය හා විදේශිය ආයතනවලටත් ප්‍රයෝජනනවත් වේ. ... " - කොරයා, (1988).

පුස්තකාල නාමාවලියේ ඇති ප්‍රයෝජන සම්බන්ධව උපාලි අමරසිරි, (1994) මෙසේ ප්‍රකාශ කර ඇත.

"A publication of this kind will be useful not only to the librarians but also to the writers, publishers and relevant government institutions. Further, this could be used as a reference source for the distribution of publication. - Amarasiri, (1994).

පුස්තකාල නාමාවලියක වැදගත්කම පිළිබඳව අශෝක සේනානි හේවගේ, (2010) අදහස් දක්වා ඇත්තේ මෙසේය.

"The directory could be used as a basic information tool to identify and gain access to libraries in Sri Lanka". - Hewage, (2010).


**ප්‍රතිඵල සහ සාකච්ඡාව - Results and Discussion**

මෙම අධ්‍යයනයට භාවිත කරන ලද මුද්‍රිත නාමාවලිවල ප්‍රකාශිත භාෂාව අනුව විශ්ලේෂණය කළ විට මෙසේය.

**වගු අංක 1. ප්‍රකාශිත භාෂාව අනුව පුස්තකාල නාමාවලි**

| භාෂාව | නාමාවලි සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| සිංහල | 17 | 65 |
| ඉංග්‍රීසි | 09 | 35 |
| දෙමළ | 00 | 00 |
| **එකතුව** | **26** | **100** |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත**




**රූප සටහන 1. ප්‍රකාශිත භාෂාව අනුව පුස්තකාල නාමාවලි**
**According to the Published Language**

ඒ අනුව අධ්‍යයනයට ලක් කරන ලද නාමාවලි විසි හයෙන් දාහතක් (17) එනම් සියයට හැට පහක් (65%) සිංහල භාෂාවෙන් ද ඉතිරි නාමාවලි නවයක් (09) එනම් සියයට තිස් පහක් (35%) ඉංග්‍රීසි භාෂාවෙන්ද පිළියෙළ කර ඇති අතර දෙමළ භාෂාවෙන් ප්‍රකාශිත එකම නාමාවලියක් වත් නොවිය.

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 97-115*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.82
එසේම නාමාවලි විසිතුනක්ම (23) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ප්‍රකාශයට පත් කර ඇත. එක් නාමාවලියක් 1982 දී කළුතර ජාතික සෞඛ්‍ය ස්වා ආයතනයේ පුස්තකාල සහ ප්‍රලේඛන සේවා ඒකකය මගින් ප්‍රකාශයට පත් කර ඇත. නාමාවලි දෙකක් (02) වෙබ් අඩවිවල පළව තිබූ අතර එම නාමාවලි දෙකම ඉංග්‍රිසි භාෂාවෙන් සම්පාදනය කර තිබුණි.


නාමාවලිවල අන්තර්ගත පුස්තකාල පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කිරිම අනුව ඒවායේ ඇතුළත් කර තිබූ තොරතුරුවල ස්වභාවය හා ප්‍රමාණාත්මක බව ඇගයීමේදී නාමාවලි (Directory) සහ තොරතුරු සංග්‍රහ (Information Bulletin) ලෙස වර්ග කල හැකිය.

**වගු අංක 2: අන්තර්ගත ව්‍යුහය අනුව නාමාවලි වර්ග**

| නාමාවලියේ ව්‍යුහය | ප්‍රමාණය | ප්‍රතිශතය (%) |
|---|---|---|
| නාමාවලි | 03 | 12 |
| තොරතුරු සංග්‍රහ | 23 | 88 |
| **එකතුව** | **26** | **100** |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත**

නාමාවලිවල අන්තර්ගත ව්‍යුහය අනුව පුස්තකාලයේ නම, ලිපිනය සහ දුරකථන අංකය පමණක් සඳහන් කර සකසා තිබූ නාමාවලි ප්‍රමාණය තුනකි. එය සමස්ත සංඛ්‍යාවෙන් සියයට දොළහක් (12%) විය. ඉතිරි නාමාවලි පුස්තකාල පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු ඇතුළත් කරමින් තොරතුරු සංග්‍රහ ලෙස සකසා තිබුණි. එය සමස්ත සංඛ්‍යාවෙන් 23 ක් වූ අතර සියයට අසූ අටක් (88%) විය. එසේම ප්‍රකාශයට පත් කර ඇති මාධ්‍යය අනුව ද නාමාවලි වර්ග කරන ලදි. එය මෙසේය.




**රූප සටහන 2 : අන්තර්ගත ව්‍යුහය අනුව නාමාවලි වර්ග**

අධ්‍යයනයට ලක් කරන ලද නාමාවලිවල ප්‍රකාශිත මාධ්‍යය අනුව ද වෙන් කර හඳුනා ගන්නා ලදි. එය වගු අංක 03 මගින් පෙන්වා ඇත.


*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 97-115*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.82

**වගු අංක 3. ප්‍රකාශිත මාධ්‍යය අනුව නාමාවලි**

| ප්‍රකාශිත මාධ්‍ය | ප්‍රමාණය | ප්‍රතිශතය (%) |
|---|---|---|
| මුද්‍රිත | 24 | 92 |
| මෘදු පිටපත් ලෙස | 02 | 02 |
| මුද්‍රිත සහ මෘදු පිටපත් ලෙස | 00 | 00 |
| **එකතුව** | **26** | **100** |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත**

ප්‍රකාශිත මාධ්‍යය අනුව ගත් විට අධ්‍යයනයට ලක් කරන ලද නාමාවලි විසි හතරක්ම එනම් සියයට අනූ දෙකක් (92%) මුද්‍රිත මාධ්‍යයෙන් විය. නාමාවලි දෙකක් එනම් සියයට දෙකක් (02%) පමණි. ඒවා මෘදු පිටපත් වශයෙන් අදාළ සංවිධානවල වෙබ් අඩවිවල පළකොට ඇත.




**රූප සටහන 3. ප්‍රකාශිත මාධ්‍ය අනුව නාමාවලි**

ශ්‍රී ලංකාවේ පළමු වරට පුස්තකාල නාමාවලියක් සකස්ව තිබුණේ 1980 දීය. එය Directory of Social Science Libraries, නම් විය. අධ්‍යයනය සඳහා භාවිත කරන ලද නාමාවලි පහත දැක්වේ. (ප්‍රකාශිත වර්ෂ අනු පිළිවෙලට පෙළ ගස්වා ඇත).

අධ්‍යයනය සිදු කරනු ලැබූ කාල වකවානුව තුළදී නව පුස්තකාල නාමාවලි දෙකක් පිළියෙළ කිරීමට අවශ්‍ය දත්ත රැස් කරමින් පවතින බවට ද තොරතුරු අනාවරණය විය. ශ්‍රී ලංකා පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් Online Library Directory in Sri Lanka සඳහාත් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මඟින් Membership Directory සඳහා දත්ත රැස් කරමින් පවතී.

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 97-115*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.82

**වගු අංක 4: සිංහල භාෂාවෙන් ප්‍රකාශය පත් නාමාවලි**

| නාමාවලියේ නම | සංස්කරණය සහ වර්ෂය | පිටු ප්‍රමාණය |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ කාර්මික ආයතන පුස්තකාල තොරතුරු සංග්‍රහය | පළමු, 1981 | 21 |
| ශ්‍රී ලංකාවේ කාර්මික ආයතන පුස්තකාල තොරතුරු සංග්‍රහය | දෙවන 1986 | 21 |
| පිරිවෙන් පුස්තකාල සංග්‍රහය | 1990 | 387 |
| අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු අභ්‍යාස විද්‍යාල පුස්තකාල නාමාවලිය | 1991 | 23 |
| ශ්‍රී ලංකා පුස්තකාල නාමාවලිය, | 1993 | 172 |
| මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය බස්නාහිර පළාත | 2012 | |
| මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය දකුණු පළාත | 2014 | |
| රජයේ ආයතන පුස්තකාල තොරතුරු සංග්‍රහය | 2014 | |
| දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - කුරුණෑගල | 1988 | 322 |
| දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - මහනුවර | 1988 | 173 |
| දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - රත්නපුර | 1988 | 85 |
| දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - ගාල්ල | 1988 | 189 |
| දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - මොණරාගල | 1988 | 44 |
| දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - කළුතර | 1991 | 139 |
| දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - පොළොන්නරුව | 1988 | 137 |
| දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - කොළඹ | 1996 | 223 |
| දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - මාතලේ | 1996 | 160 |

**මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත**

Table No. 5**:** Directories Published by English medium

| Name of the Directory | Edition & Year | No of pages |
|---|---|---|
| Directory of Social Science Libraries: Information Centers and Databases in Sri Lanka | 1980 | - |
| Directory of Health Science Libraries in Sri Lanka | 1982 | - |
| Directories of Technical Institute Libraries in Sri Lanka | -2nd 1986 | xxvii, 21 |
| Directory of Social Science Libraries, Information Centers & Databases in Sri Lanka | 1990 | 48 |
| Directory of Libraries in Sri Lanka | 1994 | 239 |
| Directory of Libraries in Sri Lanka (Public, University, Research, Technical Libraries) | 2010 | 95 |
| Directory of Library Professionals in Sri Lanka | 2013 | 76 |
| Directory of Libraries in Sri Lanka | 2015 | softcopy |
| ULA membership Directory | 2017 | softcopy |

**Source: Survey Data**

**අධ්‍යයනයට ලක් කරන ලද නාමාවලි පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු**

මෙම අධ්‍යයනය සඳහා භාවිත කළ නාමාවලිවල අන්තර්ගතය ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව ඇගයීමට ලක් කරන ලදි. එ අනුව එම නාමාවලි අතර ***දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ*** නම් නාමාවලි විශේෂයක් විය. ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 1985 දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් මඟින් මෙම නාමාවලි සම්පාදනය කර ඇත. එක් එක් දිස්ත්‍රික්කවල සිටි ප්‍රධාන පුස්තකලයාධිපතිවරුන්ගේ දායකත්වයෙන් තොරතුරු ඒකරාශි කර ගෙන ඇති අතර එම තොරතුරු පදනම් කරගෙන මෙම නාමාවලි සම්පාදනය කර තිබේ.

අධ්‍යයනයට අනුව දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ නම් පුස්තකාල නාමාවලි ව්‍යාපෘතියේ ප්‍රථම නාමාවලිය කුරුණෑගල දිස්ත්‍රක්කය පිළිබඳව 1988 දී. ප්‍රකාශයට පත් කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශයට පත් කළ නාමාවලි අතුරෙන් භාවිත කල හැකි වූයේ නාමාවලි නවයක් (09) පමණි. එනම් 1988 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කර ඇති කුරුණෑගල, මහනුවර, රත්නපුර, ගාල්ල, මොණරාගල, පොළොන්නරුව යන දිස්ත්‍රික්ක ආවරණය කර සම්පදානය කොට තිබෙන නාමාවලි හය, 1991 දී කළුතර දිස්තිත්‍රික්ක නාමාවලිය සහ 1996 වර්ෂයේ දී කොළඹ, මාතලේ යන දිස්ත්‍රික්ක පිළිබදව සම්පාදනය කර ඇති නාමාවලි දෙක (02) පමණි.

මෙම නාමාවලිවල ඒක් ඒක් දිස්ත්‍රික්කය තුළ එවකට පැවති පුස්තකාල එය අයත් වර්ගය අනුව එනම්, මහජන, පාසල්, පිරිවෙන්, විශ්වවිද්‍යාල, අධ්‍යාපන විද්‍යා පීඨ, කාර්මික විද්‍යාල, විශේෂ ආදි වශයෙන් පැවති සියලුම පුස්තකාල ආවරණය වන පරිදි සම්පාදන කර ඇත. එම පුස්තකාල පිළිබඳ සවිත්රාත්මක තොරතුරු ඇතුළත් කර ඇත. (පසු කාලීනව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් ප්‍රකාශිත ***ශ්‍රී ලංකා පුස්තකාල නාමාවලිය*** - 1993 සැකසීමට මෙම තොරතුරු සංග්‍රහ පාදක කොට ගෙන ඇත.)

ලයනල් අමරකෝන් මහතා විසින් සම්පාදනය කොට ඇති ***Directory of Health Science Libraries in Sri Lanka - 1982*** නාමාවලිය පිටු 18, කින් යුක්තය. කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනයේ පුස්තකාල හා ප්‍රලේඛන සේවා ඒකය මගින් ප්‍රකාශයට පත්කොට ඇත. එවකට ඒම විෂයය ක්ෂේත්‍රය ආවරණය කරනු ලැබූ පුස්තකාල හතලිහකට (40) ප්‍රශ්නාවලි යොමු කර ඇති අතර ප්‍රතිචාර දක්වා ඇත්තේ දහතුනක් (13) පමණ වූ අතර එම තොරතුරු ඇසුරෙන් මෙම නාමාවලිය සකස් කර ඇත. මෙම නාමාවලියේ Name of the Library, Address, Year of Established, Staff, Name of the Librarian, Subject scope, Resource Base, Special Collection, Equipment, Indexing, Current Awareness Service (CAS), Back up services. යන තේමා යටතේ එහි අන්තර්ගත පුස්තකාල පිළිබඳ තොරතුරු ඇතුළත්වේ. මෙම නාමාවලිය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සතුව පවති.

1981 දී ප්‍රකාශයට පත් කර ඇති ***ශ්‍රී ලංකාවේ කාර්මික ආයතන පුස්තකාල තොරතුරු සංග්‍රහයේ*** දෙවන සංස්කරණය 1986 දී ප්‍රකාශයට පත් කොට ඇත. මෙම තොරතුරු සංග්‍රහයේ ඇති විශේෂත්වය වන්නේ ලංකාවේ කාර්මික විද්‍යාල පිළිබඳව ආරම්භය හා විකාශය පිළිබඳ තොරතුරු මෙන්ම නාමාවලියේ අන්තර්ගත දත්ත ඇසුරෙන් වඩාත් විස්තරාත්මක නිබන්ධන ලෙස පිළියෙළ කර තිබීමය. මෙම නාමාවලි දෙකෙහි ඉංග්‍රීසි පරිවර්තනය ***Directories of Technical Institute Libraries in Sri Lanka*** නමින් ප්‍රකාශයට පත් කොට ඇත.

1990 දී ප්‍රකාශයට පත් කර ඇති ***පිරිවෙන් පුස්තකාල තොරතුරු සංග්‍රහයේ*** ලංකාවේ දිස්ත්‍රික්ක විස්සක (20) පිහිටා ඇති පිරිවෙන් පුස්තකාල තුන්සිය අසූහතක (387) තොරතුරු සඳහන් වේ. මෙම නාමාවලියට අනුක්‍රමණිකාවක් සම්පාදන කර තිබීම විශේෂත්වයක් ලෙස දැක්විය හැක.

***අධ්‍යාපන විද්‍යා පීඨ සහ ගුරු අභ්‍යාස විද්‍යාල පුස්තකාල*** පිළිබඳ නාමාවලියක් 1991 දී සම්පාදනය කර ඇති අතර, එහි අධ්‍යාපන විද්‍යා පීඨ හතක (07) සහ ගුරු විද්‍යාල පහළොවක (15) පුස්තකාල පිළිබඳ තොරතුරු සඳහන් කර ඇත. ආයතනයේ නම, ලිපිනය, දුරකථන අංකය, දිස්ත්‍රික්කය, ආරම්භය, ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය සංඛ්‍යාව. ප්‍රධාන අංශ, විදුහල්පති/පීඨාධිපති. ආවරණය කරනු ලබන විෂයයන්, පුස්තකාල ගොඩනැගිල්ලේ ප්‍රමාණය, පුස්තකාලය සතු සම්පත්, පුස්තකාල සේවා, කාර්යය මණ්ඩලය, මුදල් ප්‍රතිපාදන යන ශිර්ෂ යටතේ සවිස්තරාත්මකව තොරතුරු දක්වා ඇත. මෙම නාමාවලියේ දක්නට ලැබුණු විශේෂත්වයක් වුයේ එහි අනුක්‍රමණිකාවක් සකස් කොට තිබීමය. මෙම නාමාවලිය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රකාශන අංශය මගින් ප්‍රකාශයට පත්කොට ඇත.

***1993 ප්‍රකාශිත ශ්‍රී ලංකා පුස්තකාල නාමාවලිය*** ඊට පෙර වර්ෂවල කරන ලද දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණයන්හි දත්ත පදනම් කරගෙන එවකට ලංකාවේ පැවති සියලුම පුස්තකාල ආවරණය කරමින් සම්පාදනය කර ඇත. පුස්තකාලයේ නම, ලිපිනය සහ දුරකථන අංකය පමණක් සඳහන් සංක්ෂිප්ත කර සකසන ලද නාමාවලියකි. එහි ඉංග්‍රීසි පරිවර්තනය 1994 දී ***Directories of Libraries in Sri Lanka***, නමින් ප්‍රකාශයට පත් කොට ඇත. මෙම නාමාවලියේ ලංකාව පුරා විසිර පවතින පාසල්, පිරිවෙන්, කාර්මික විද්‍යාල, ගුරු විදුහල්, විශ්වවිද්‍යාල, මහජන සහ විශේෂ පුස්තකාල ආවරණය වන පරිදි සම්පාදනය කර ඇත. ශ්‍රී ලංකා පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ප්‍රකාශයට පත්කොට ඇත.

2010 වර්ෂයේදී සම්පාදනය කර ඇති ***Directory of Libraries in Sri Lanka 2010 (Public, University, Research & Technical Libraries)*** යන නාමාවලියේ පුස්තකාලවල නම, ලිපිනය සහ

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 97-115*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.82
දුරකථන අංකය පමණක් සඳහන් කරමින් සම්පාදනය කර ඇත. මෙම නාමාවලියේ අන්තර්ගත පුස්තකාල සංඛ්‍යාව 1276 ක් වන අතර එහි මහජන පුස්තකාල 1160 ක්, විශ්වවිද්‍යාල පුස්තකාල 35 ක්, ගුරු විදුහල් හා විද්‍යා පීඨ පුස්තකාල 10 ක්, පර්යේෂණ පුස්තකාල 21 ක්, කාර්මික විද්‍යාල පුස්තකාල 37 ක් සහ විශ්වවිද්‍යාල ආයතන පුස්තකාල 13 ක් ආවරණය කර ඇත.

2014 වර්ෂයේදි සම්පාදනය කර ඇති ***රාජ්‍ය ආයතන පුස්තකාල තොරතුරු සංග්‍රහයේ*** රාජ්‍ය ආයතන යටතේ පවත්නා පුස්තකාල 264 ක තොරතුරු ආවරණය කර ඇත. පුස්තකාලයේ නමින් ආකාරාදි අනු පිළිවෙලට ගොනු කර ඇත. මෙහි ආයතනයේ නම, ආයතනය අයත් වන අමාත්‍යාංශය, ආයතනයේ ලිපිනය, පුස්තකාලය අයත් අංශය, පුස්තකාල සම්පත්, පුස්තකාලයේ ප්‍රධාන අංශ, පුස්තකාලය මගින් සපයන සේවා, කාර්යය මණ්ඩලය, පාඨක සංඛ්‍යාව, භාවිත වන වර්ගීකරණ ක්‍රමය, භාවිත කරන මෘදුකාංග, තොරතුරු ලබාගත හැකි මාර්ග යන කරුණු ඇතුළත් කොට ඇත. ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පර්යේෂණ අංශය මගින් ප්‍රකාශයට පත්කොට ඇත.

මහජන පුස්තකාල සම්බන්ධව මෑත කාලීනව සමීක්ෂණයක් ඇසුරෙන් නාමාවලි සම්පාදනය කර ඇති බව අනාවරණය විය. ඒ අනුව 2012 ප්‍රකාශිත ***මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය - බස්නාහිර පළාත*** නම් තොරතුරු සංග්‍රහයේ බස්නාහිර පළාත තුළ පවත්නා නගර සභා සහ ප්‍රාදේශිය සභා යටතේ පිහිටුවා ඇති ප්‍රධාන පුස්තකාල මෙන්ම ශාඛා පුස්තකාල ද ආවරණය කරමින් පුස්තකාල 165 ක් පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇත. 2014 දී ප්‍රකාශිත ***මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය - දකුණු පළාත*** නම් තොරතුරු සංග්‍රහයේ දකුණු පළාත තුළ පවත්නා නගර සභා සහ ප්‍රාදේශිය සභා යටතේ පිහිටුවා ඇති ප්‍රධාන පුස්තකාල මෙන්ම ශාඛා පුස්තකාල ද ආවරණය කරමින් පුස්තකාල 144 ක් පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇත. මෙම මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහවල පුස්තකාලයේ නම, අධිකාරි ආයතනය, අධිකාරි ආයතනයේ නම, දිස්ත්‍රික්කය, පුස්තකාලයේ ලිපිනය, පුස්තකාල සම්පත්, ප්‍රධාන අංශ, පුස්තකාලය මගින් සපයන සේවා, භාවිත කරන වර්ගීකරණ ක්‍රමය, පුස්තකාලයේ ශ්‍රේණිය, පාඨක සංඛ්‍යාව, දුරකථන අංකය, විද්‍යුත් තැපැල, සහ කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

(ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පර්යේෂණ අංශයේ නිළධාරින් සමඟ කරන ලද සාකච්ඡාවේදි මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු සහ නැගෙනහිර පළාත හැර ලංකාවේ සෙසු සියලුම පළාත්වල මහජන පුස්තකාල පිළිබඳ තොරතුරු සමීක්ෂණයක් මගින් රැස්කර ගත් බවත් අනෙකුත් පළාත් සම්බන්ධ නාමාවලි සම්පාදනය කොට ඇති බවත්, පාඨක පරිශීලනය සඳහා තවමත් යොමු කර නොමැති බව ද අනාවරණය විය.)

*Journal of Sri Lanka Library Review, Volume 39, Issue II, June 2025, 97-115*
*DOI:* https://doi.org/10.4038/sllr.v39i2.82

**පුස්තකාලවේදීන් සම්බන්ධව සම්පාදනය කර ඇති නාමාවලි - Directories for Library Professionals**

පුස්තකාලවේදීන්/වෘත්තිකයින්/පුස්තකාලයාධිපතීන් ආවරණය වන පරිදි පිළියෙළ කර ඇති නාමාවලි තුනක් (03) විය. ඉන් එක් නාමාවලියක් මුද්‍රිත ප්‍රකාශනයකි. එය ***Directory of Library Professionals In Sri Lanka, 2013*** නම් විය. මෙම නාමාවලිය ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ග්‍රන්ථ විඥාපන සේවා අංශය මගින් සම්පාදනය කර ඇති අතර මෙහි පුස්තකාලවේදීන් 248 දෙනෙකුගේ තොරතුරු ආවරණය කර ඇත. පුස්තකාලවේදියාගේ නම, ලිපිනය අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම්, විශේෂත්වයක් දක්වන ක්ෂේත්‍ර දුරකථන අංක, විද්‍යුත් ලිපිනය, සාමාජිකත්වය ලබා ඇති සංගම් ආදි ලෙස තොරතුරු ඉදිරිපත් කර ඇත. 2013 වර්ෂය වන විට ලංකාවේ පුස්තකාලවේදීන් විශාල ප්‍රමාණයක් සිටි. නමුත් මෙම නාමාවලියට තොරතුරු සපයා ඇත්තේ සීමිත පිරිසක් බව දක්නට ලැබිණ. දත්ත රැස් කිරිමේදි පුස්තකාලවේදීන් හදුනාගැනිමට හැකි වූ ප්‍රමාණය අවම වීම හෝ අදාළ පුස්තකාලවේදීන් තොරතුරු ලබා දීම සීමා විම නිසා නාමාවලියේ අන්තර්ගත පුස්තකාලවේදීන්ගේ තොරතුරු ප්‍රමාණය දෙසිය හතලිස් අටකට (248) සිමාවි ඇත.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් සම්පාදනය කරන ලද ***Directory of Libraries in Sri Lanka*** නාමාවලිය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වෙබ් අඩවියේ පළකර ඇති අතර එහි ඇතුළත් වනුයේ මෙම සංගමයේ සාමාජිකයින් විසින් ලබාදෙන ලද පුස්තකාලවල තොරතුරු පමණි. 2013 ජුනි මාසයේදී යාවත්කාලීන කර ඇති අතර පුස්තකාල 120 ක තොරතුරු ඇතුළත්ය. ඉංග්‍රිසි අකාරාදි පිළිවෙළට පුස්තකාල නාමය යටතේ තොරතුරු ගොනු කර ඇත. පුස්තකාලය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් සහ අදාළ සාමාජිකයාගේ නම සහ තනතුර ද ඇතුළත්ව අනෙකුත් සෙසු තොරතුරු, ලිපිනය, දුරකථන අංක, විද්‍යුත් ලිපිනය සහ වෙබ් ලිපිනය සඳහන් කර ඇත. එසේම මෙම නාමාවලිය බාගත කර හැකි පරිදි වෙබ් පිටුවේ දක්වා ඇති අතර පිටු 73 කින් සමන්විත කෘතියකි. (ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ලියාපදිංචි සාමාජිකයින් 1000 කට අධික වන අතර, සක්‍රීය සාමාජිකයින් 550 අධික ප්‍රමාණයක් සිටි. නමුත් මෙම නාමාවලියට පුස්තකාල 120 ක තොරතුරු පමණක් ඇතුළත් කොට තිබිමෙන් පැහැදිලි වනුයේ එහි සමස්ත සාමාජිකයින්ගේ තොරතුරු ආවරණයවී නොමැති බවය.)

පුස්තකාල වෘත්තිකයන් සම්බන්ධ අනෙක් නාමාවලි දෙක එම නාමාවලි සම්පාදනය කළ සංවිධානවල වෙබ් අඩවිවල පළ කර ඇති **Directory of Libraries in Sri Lanka, 2015 (softcopy)** සහ ***ULA membership Directory, 2017 (softcopy)*** නම් වේ.

විශ්වවිද්‍යාලයීය පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය මගින් ප්‍රකාශයට පත් කර ඇති ***ULA membership Directory*** නමින් පවත්වාගෙන යනු ලබන මෙම නාමාවලිය විශ්වවිද්‍යාලයීය පුස්තකලයාධිතීන්ගේ සංගමය මගින් සකස් කරනු ලබයි. මෙහි ඇතුළත් වනුයේ මෙම සංගමයේ සාමාජිකයින්ගේ තොරතුරු පමණකි. 2017 වර්ෂයේ අවසන් වරට යාවත්කාලීන කර ඇති අතර විශ්වවිද්‍යාලයීය පුස්තකාලයාධිපතිවරුන් 142 ගේ තොරතුරු ඉදිරිපත් කර ඇත. මෙම නාමාවලිය පරිශීලනය කළ හැක්කේ සාමාජිකයින්ට පමණකි. සාමාජිකයින් පිළිබඳ පහත සඳහන් තොරතුරු නාමාවලිය මගින් ඉදිරිපත් කර ඇත. Name, Membership Number, Photograph of Member, Designation, Official Address, Research and Interest Area, Other Organization membership, Private address, Email and Contact Numbers. (මූලාශ්‍රය: සංගමයේ ලේකම්තුමියගෙන් වාචිකව ලබා ගන්නා ලදි). Ratnayake සහ Munasinghe (2021) විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාවේ දක්වා ඇත්තේ, ආයතන පුස්තකාල අතර සහයෝගීතාවය හා සම්පත් හුවමාරුව වර්ධනය කිරීම සඳහා පුස්තකාල සහ පුස්තකාලයාධිපතිවරුන්ගේ ජාලයක් ස්ථාපිත කිරීම අවශ්‍ය බවයි. එමෙන්ම, එම පර්යේෂණයෙන් පෙනී යන්නේ, ආයතන පුස්තකාල නාමාවලියක් සකස් කිරීම මඟින් එවැනි ජාලයක් සංවර්ධනය කිරීම සඳහා මූලික පදනමක් සැලසිය හැකි බවයි.

### මෘදු පිටපත් වශයෙන් පවතින නාමාවලි - Directories as a Soft copies

පුස්තකාල නාමාවලි පිළිබඳ අධ්‍යයනයේදි හමු වූ තවත් වැදගත් නාමාවලි දෙකක් විය. ඒවා මෘදු පිටපත් වශයෙන් එම නාමාවලි සම්පාදිත ආයතනවල වෙබ් අඩවිවල ප්‍රකාශයට පත් කොට ඇත.

1. ULA Membership Directory
2. Directory of Libraries in Sri Lanka

(මෙම නාමාවලි පිළිබඳ තොරතුරු ඉහත පුස්තකාලවේදීන් පිළිබඳ නාමාවලි යටතේ දක්වා ඇත).

### නිගමන - Conclusions

අධ්‍යයනය සඳහා මුද්‍රිත නමාවලි විස හතරක් (24) සහ මෘදු පිටපත් ලෙස පවතින නාමාවලි දෙකක් (02) භාවිත කරන ලදි. නාමාවලිවල ව්‍යුහය හා අන්තර්ගතය අනුව ඇතැම් නාමාවලි දුරකථන නාමාවලි මෙන් අදාළ පුස්තකාලයේ නම හා ලිපිනය පමණක් සහිතව සම්පාදනය කර තිබුණි. මෙම නාමාවලි මඟින් පුස්තකාලයේ ලිපිනය දුරකථන අංකය පමණක් සොයා ගත හැකිය.

බොහෝ නාමාවලි මූලික තොරතුරුවලට අමතරව පුස්තකාලය සම්බන්ධ සෙසු තොරතුරු ඇතුළත් කර තොරතුරු සංග්‍රහය ලෙස සම්පාදනය කොට තිබිණ. එම නාමාවලි තීන්දු තීරණ ගන්නා අයට මෙන්ම ප්‍රතිපත්ති සැලසුම්කරුවන්ට වඩාත් ඵලදායි වේ. ඒසේම පුස්තකාල සම්බන්ධව, පුස්තකාලවේදීන් සම්බන්ධව තොරතුරු ලබා ගැනීමට හැකිය.

මුල් යුගයේ සම්පාදනය කර ඇති නාමාවලිවල පැවති ක්‍රමානුකූල බව හා එහි ආකෘතිය තුළ පාඨකයාට පහසුවෙන් අදාළ අන්තර්ගත තොරතුරු වෙත ප්‍රවේශවීමට හැකි ආකාරයෙන් අනුක්‍රමණිකාව භාවිත කොට තිබිණ.

අතැම් නාමාවලිවල එහි අන්තර්ගත තොරතුරු ඇසුරෙන් පිළියෙල කරන ලද වාර්තාවලින් සමන්විතය. නමුත් පසුකාලීනව ප්‍රකාශයට පත් වූ නාමාවලිවල එම ගුණාංග අන්තර්ගත නොවන බව දක්නට ලැබිණ.

නමාවලියක් සම්පාදනය කිරීමේ දී ග්‍රන්ථයක/කෘතියක ඇතුළත් විය යුතු පොදු ග්‍රන්ථවිද්‍යාත්මක අංග එනම්, ග්‍රන්ථනාම පිටුව, පටුන, පෙළ, අනුක්‍රමණිකාව, සූචිය ආදි අංග ඇතුළත්ව නිම කළ හැකි නම් එය පරිශීලනය කරන පාඨකයින්ට වඩාත් පහසුය.

මෙම නාමාවලි යම් අරමුණු උදෙසා පරිශීලනය කිරිමේදි එම නාමාවලිවල අන්තර්ගත තොරතුරු අනුව නාමාවලියේ තේමාවට අදාළ සියලුම පුස්තකාල ආවරණය නොවීමත්, යාවත්කාලීන නොවීමත් නිසා නාමාවලියක පවතින ගුණාත්මක ලක්ෂණ අඩුවී ඇති බව දක්නට ලැබිණ. එම නිසා නාමාවලියක් සම්පාදන කිරීමේදී එහි තේමාවට අදාළ සමස්ත පුස්තකාල හෝ පුස්තකාලවේදීන් පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතුය.

වර්තමානයේ නව තාක්ෂණය භාවිත කරමින් පවතින පුස්තකාල නාමාවලි යාවත්කාලින කිරිමට කටයුතු කළ යුතුය. ඒසේම මාර්ගගත දත්ත පදනම් ඔස්සේ නාමාවලි ප්‍රකාශයට පත්කිරිම හා යාවත්කාලීන කිරිම වඩාත් පහසුවේ.

අධ්‍යයනය සිදුකළ කාලවකවානුව තුළ ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පර්යේෂණ අංශය මගින් මාර්ගගත දත්ත පදනමක් ස්වරූපයෙන් පුස්තකාල නාමාවලියක් ද, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් එහි සාමාජිකයන් පිළිබඳ නාමාවලියක් සහ විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකලයාධිපති විසින් විශ්වවිද්‍යාලයීය පුස්තකාල වෘත්තිකයන් පිළිබඳ නාමාවලියක් ද සම්පාදනය කරමින් පවතින බවට ද තොරතුරු අනාවරණය විය.

**යෝජනා - Suggestions**

නාමාවලියක් සම්පාදනය කිරිමට අවශ්‍ය තොරතුරු රැස්කරන අවස්ථාවන්හිදි ඊට අදාල පුස්තකාල භාරව කටයුතු කරන නිලධාරින් හෝ පුස්තකාලවේදීන් නිවැරදිව සහ අප්‍රමාදව තම පුස්තකාලය

පිළිබඳ තොරතුරු/පුස්තකාලයාධිපති වශයෙන් තමා පිළිබඳ තොරතුරු සැපයීම වෘත්තීයවේදියකු ලෙස තම වගකීමක් ලෙස සලකා කටයුතු කළ යුතුය.

මෙතෙක් ප්‍රකාශයට පත්ව ඇති නාමාවලිවල ඇතුළත් පුස්තකාලවලට අමතර විවිධ විෂයය ක්ෂේත්‍ර යටතේ, ආයතන යටතේ අලුතින් ආරම්භ කරන ලද පුස්තකාල ඇත. පෞද්ගලික අධ්‍යාපන ආයතන සම්බන්ධව සහ පෞද්ගලික අංශයේ ආයතන යටතේ පවත්නා පුස්තකාල ද ඇත. එම පුස්තකාල පිළිබඳ තොරතුරු රැස්කර ගැනීමට සමාජය දැනුවත් කිරිමේ වැඩ පිළිවෙළක් ජාතික පුස්තකාල සේවා මණ්ඩලය හෝ වෙනත් ජාතික අධිකාරි ආයතනයක් මගින් සිදුකිරිම කාලීන අවශ්‍යතාවක් ලෙස සැලකිය යුතුය.

පුස්තකාල සහ පුස්තකාලවේදීන් සම්බන්ධ නාමාවලියක් සම්පාදනය කිරිම සරල කර්තව්‍යයක් නොවේ. එය යම් විෂයානුබද්ධ පිළිවෙළකට සිදු කළ යුතුය. එම නිසා යථානුරූපව තොරතුරු ඒකරාශි කරගැනීම සඳහා දැඩි කැපවීමක් කළ යුතුය.

සාම්ප්‍රදායික ක්‍රමවලට නාමාවලියක් සැකසීම අසීරු කර්තවයක් වුවද, වර්තමානයේ තොරතුරු තාක්ෂණය භාවිත කොට පහසුවෙන් නාමාවලී සම්පාදනය කළ හැකිය. ඒම නිසා පවතින නාමාවලි අඛණ්ඩව යාවත්කාලීන කළ යුතුය.

**ආශ්‍රිත මූලාශ්‍ර - References**

ජාතික පුස්තකාලය. (1988). *දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - කුරුණෑගල*. කොළඹ: ජාතික පුස්තකාලය: ප්‍රකාශන අංශය.

*දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ - කුරුණෑගල (1988)* . කොළඹ: ජාතික පුස්තකාලය: ප්‍රකාශන අංශය.

විජයතුංග හරිස්චන්ද්‍ර (සම්.), (2014). *ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂය.*

Amarasiri, M. S. U. (1994). *Directory of libraries in Sri Lanka* (Introduction).

Balasooriya, S. (2013). *Directory of library professionals in Sri Lanka* (Preface). Colombo: National Library and Documentation Centre.

Barman, B. (2020). Directory of Library and Information Science Professionals in Assam. *Library Philosophy and Practice (e-journal)*, (3833). https://digitalcommons.unl.edu/libphilprac/3833

Cambridge University Press. (2003). *Cambridge advanced learner's dictionary*. Washington, DC: Cambridge University Press.

Hewage, A. S. (2010). *Directory of library professionals in Sri Lanka* (Preface).Colombo

National Library. (1994). *Directory of libraries in Sri Lanka*. Colombo: National Library and Documentation Services Board.

National Library. (2010). *Directory of library professionals in Sri Lanka (2010): Public, university, research & technical libraries*. Colombo: National Library and Documentation Services Board.

National Library and Documentation Centre. (2013). *Directory of library professionals in Sri Lanka*. Colombo: National Library and Documentation Centre.

Prytherch, R. (Ed.). (2004). *Harrod's librarians glossary and reference book* (10th ed.). Ashgate. https://epdf.pub/harrods-librarian-glossary-and-reference-book-a-directory-of-over-10200-terms-o.html

Ratnayake, R. M. S. N., & Munasinghe, D. (2021, December). *Collaboration and sharing of resources and services among institute libraries of the national universities in Sri Lanka: With recommendations for improvement*. Paper presented at the Online International Conference on Knowledge Management in Higher Education Institutions (ICKHI 2021), India.

Sri Lanka Library Association. (n.d.). https://www.slla.org.lk

University Librarians Association of Sri Lanka. (n.d.). https://www.slula.org